# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த.பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 668/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 18/04/2024 පැය 1940

## මාධ්‍ය නිවේදනය

**රැකියා ලබා දෙන බව පවසා සංචාරක වීසා මඟින් රුසියානු රටට පුද්ගලයින් පිටත්කරන ලද සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

රුසියානු රටේ ආරක්ෂක අංශයන්හි සිවිල් සේවකයින් ලෙස රැකියා ලබා දෙන බවට පවසා සංචාරක වීසා මගින් පුද්ගලයින් රුසියානු රටට පිටත් කර බලහත්කාරයෙන් රුසියානු යුද්ධය සඳහා යොමුකර මිනිස් වෙළඳාමට ලක් කිරීමක් සම්බන්ධයෙන් 2024.04.03 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලද පැමිණිල්ලක් ලැබී ඇත.

ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තැනැත්තන් වෙළදාම, ජාවාරම් විමර්ශන හා සමුද්‍රිය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් විමර්ශන සිදුකර 2024.04.17 වන දින සවස් කාලයේදී රජවැල්ල හා වාරියපොල ප්‍රදේශ වලදී මෙම සිද්ධියට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 61 හා 63 වයස් වල පසුවන රජවැල්ල හා වාරියපොල ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන් දෙදෙනාගෙන් එක් සැකකරුවෙකු විශ්‍රාමික යුධ හමුදා මේජර්වරයෙකු වන අතර මොවුන් විසින් මෙරට සිටින තවත් විශ්‍රාමික යුධ හමුදා නිළධාරීන් කිහිප දෙනෙකුගේද සහාය ඇතිව දැනට විශ්‍රාමිකව සිටින ත්‍රිවිධ හමුදා සාමාජිකයින්, රුසියානු රටේ යුධ හමුදාවේ රැකියා බලා දෙන බව පවසා සංචාරක වීසා මගින් රුසියානු රටට යොමුකර එරට යුධ හමුදාව වෙත කුලී හේවායන් ලෙස යොදවා ඇති බවටත් මෙලෙස ශ්‍රී ලාංකික පුද්ගලයින් විදේශ ගත කිරීමට රුපියල් ලක්ෂ 02 සිට

ලක්ෂ 15 දක්වා මුදල් ලබා ගන්නා බවටත් මෙතෙක් කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත.

සැකකරුවන් 2024.04.18 වන අද දින මීගමුව ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2024.05.02 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත. තැනැත්තන් වෙළදාම, ජාවාරම් විමර්ශන හා සමුද්‍රිය අපරාධ විමර්ශන කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**